# කෘෂි තාක්ෂණ තොරතුරු

NAICC

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබාදීමේ අත්වැලකි

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි

තාක්ෂණික පත්‍රිකා අංක 34 - 2021 මැයි





රසායනික පොහොර භාවිතය පිළිබඳව විවාදාත්මක වාතාවරණයක් වෙනදාටත් වඩා උද්ගතවී ඇති බවක් පෙනේ. ඊට ආසන්නම හේතුව වන්නේ ලබන මහ කන්නයේ සිට රසායනික පොහොර භාවිතයට සීමා පනවන බවට රජය විසින් කර ඇති ප්‍රකාශයයි. ඇතැම් පුවත්පත් ගොවීන්ගේ තොරතුරු උපුටා ගනිමින් පවසන්නේ විවෘත වෙළඳපොලේ රසායනික පොහොර දැනටමත් හිඟ බවය. ගතවීගෙන යන යල



කන්නයට වුවත් ප්‍රමාණවත් පොහොර සාත්තුවක් තම වගාවට දීගත නොහැකි බව  ගොවීන් පවසනවායයි එම ආරංචි වලින් කියවේ. යැපුම් ගොවිතැනක් නොවන තත්වයෙන් නොහොත් තීව්‍රකරණයට හසුවූ වගාවක් වශයෙන් ගොවිතැන පවත්වාගෙන යන්නේනම්, එය තිරසාර ලෙස කරගෙන යාහැකි වන්නේ පසෙන් සන්තතව ඉවත්වෙන පෝෂ්‍ය පදාර්ථයන් අඛණ්ඩව කෙටි කාලයක් තුලදී නැවත පසට සපයන්නේනම් පමණි. එසේ නොවන්නේනම් කන්න කීපයක් වගාකර අස්වැන්න ගොවිබිමෙන් ඉවත්කරගැනීමේ ප්‍රතිපලයක් ලෙස ටික දිනකින් භූමිය නිසරුවෙන අතර පැරණි හේන් වගාවේදී මෙන් ගොවියාට ඇති විසඳුම වන්නේ භූමිය අතහැරදමා වෙනත් භූමියක් සොයායාමයි. එහෙත් වර්තමානය සඳහා එම විසඳුම සාධාරණ නැත. මේ නිසා ගොවියා විසින් භූමියෙන් ඉවත්කළ දෑ, බාහිරින් ගෙනවිත් ගොවිබිමට හෙළිය යුතුය. හරිත විප්ලවයත් සමග ගොඩනැගුනු රසායනික පොහොර සංස්කෘතියට අනුව අද දවසේ 2% ක් පමණ වන සමස්ත ලෝකයේ කාබනික නිෂ්පාදන ගොවිබිම් හැරුණුවිට අන් 98% ම රසායනික පොහොර භාවිතා කරමින් ගොවිතැන් කරමින් සිටී. කාබනික පොහොරවල අන්තර්ගත 1% ක් පමණ වන නයිට්‍රජන් අන්තර්ගතය හා සසඳන කල යූරියා වැනි කෘතිම පොහොරක නයිට්‍රජන් අන්තර්ගතය 46% ක් පමණ වීමෙන් ගොවියාගේ ආකර්ෂණය ඒ වෙත යොමුවීම සම්බන්ධයෙන් ඔහුට දොස් කීමටද නොහැකිය. කවුරුත් බලන්නේ අඩු වියදමකින් හා අඩු වෙහෙසකින් තම වගාවේ අස්වැන්න ටික ගෙට ගන්නටය.

කෙසේ වෙතත් කලකට ඉහතදී ක්‍රියාත්මක වූ පර්යේෂණ වැඩසටහන් වලදී නම්, රසායනික පොහොර වෙනුවට කාබනික ද්‍රව්‍ය යෙදීම පිළිබඳව ගැඹුරින් කරුණු සොයාබලා තිබේ. සක්‍රියව ඊට දායකත්වය සැපයූ ජ්‍යෙෂ්ඨ පර්යේෂකයෙක් වන එස්. එන්. ජයවර්ධන මහතා පැවසුවේ මෙවන් අදහසකි.

**"හුඟ දෙනෙක් ප්‍රශ්ණ කරන දෙයක්නේ කුඹුරක් වැනි විශාල පරිසරයකට අවශ්‍ය තරමට කාබනික ද්‍රව්‍ය සොයාගන්නේ කොහොමද කියන එක. අවට තිබෙන ගහකොළ කපලා දැම්මත් මේ අභියෝගය ජයගැනීම පහසු එකක් නෙවෙයි. කුඹුරේම යම් රනිල වවන්න කියලත් කියනවා. සෙස්බේනියා ශාකය මේ සඳහා යෝජනා කරලා පර්යේෂණ පවා කෙරිලා තියෙනවා. නමුත් කාෂ්ඨීයව හැදෙන කඳ නිසා යම්කිසි හේතුවක් නිසා නිසි වයසට ගස්ටික පොළොවට යට නොකළහොත්, ඊළඟ කන්නයේ වී වගාවට ඇතිවන්නේ බාධාවක්. අනිත් එක සෙස්බේනියා ආහාර බෝගයකුත් නෙවෙයි. අපි පර්යේෂණ කරලා තියෙනවා උඳු, කව්පි හෝ මුං වගා සමග. කන්නයක ගොයම් කැපූ පසු ඊළඟ කන්නය තෙක් ගතවෙන කාල පරාසය තුළදී මෙම බෝග දෙකෙන් එකක් වපුරන්න පුළුවන්. අස්වැන්න ලැබුනොත් ඒක අතිරේක ආදායමක් ලෙස බාරගන්නවා. නැතත් කමක් නෑ. නියමිත දිනට බිම් සකස්කිරීමේදී රනිල බෝගයත් සමග භූමිය සී සානවා. අපේ පළමු බලාපොරොත්තුව වන්නේ ඊළඟ කන්නයේ ගොයමට හොඳ කාබනික පොහොර ප්‍රමාණයක් ලබාදීමයි."**

ජයවර්ධන මහතා තවත් කරුණක් පෙන්වා දෙන්නේය. ප්‍රධාන කන්නය තුල කුඹුරේ වී වගාව කෙරෙන අතරවාරයේ නියර මත අදාළ රනිල බෝගය සිටුවන්නේ නම් මෙහිදී යෝජනා කෙරෙන මීළඟ කන්නයේ ඉපනැල්ලේ වගාවට අවශ්‍ය බීජ ප්‍රමාණය නිරායාසයෙන්ම සාදා ගැනීමටද හැකියාවක් ඇති බවය. ඒ වෙනුවෙන් ගොවීනට උපදෙස් දීමත් යම්කිසි ආරම්භක දිරිගැන්වීමක් සැපයීමත් වහ වහා ආරම්භ කල යුත්තකි. පවත්වා ඇති පර්යේෂණයන්හි ප්‍රතිපල වශයෙන් අක්කරයකට අමතර බුසල් 10-12 ක පමණ ප්‍රමාණයක් මෙවන් කුඹුරු වලින් ලබාගැනීමට සමත්වීම තුලින් පෙනෙන්නේ ක්‍රමවේදයේ තිබෙන සාධාරණත්වයයි. ගොඩ ගොවිතැන සඳහාද ගැලපෙන මෙවන් පර්යේෂණ තොරතුරු රැසක් එදා බිහිවී



තිබුනත්, සමාජයේ වැඩි නැඹුරුවක් තිබුනේ රසායනික පොහොර භාවිතයට නිසා ප්‍රායෝගිකව මේවා ක්‍රියාත්මක කරන්නට ගොවීන් උනන්දු වූයේ නැත. එහෙත් අද දවසේ මෙම පර්යේෂණ පත්‍රිකා වලට යලිත් ජීවය ලැබිය යුතු තත්වයක් තිබේ. රසායනික පොහොර නොමැති අඩුව පිරිමසන්නට ක්‍රම ක්‍රමයෙන් හෝ අපට හැකිවන්නේ පසට කෙරෙන අඛණ්ඩ කාබනික සත්කාරයන් විවිධ මාර්ග ඔස්සේ සවිබල ගැන්වීමෙන්ය.

**පිටපත :** සනත් එම්. බණ්ඩාර - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ, ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නොරුව

**තාක්ෂණික කරුණු :** එස්. එන්. ජයවර්ධන, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ, උපයෝගිතා පර්යේෂණ ඒකකය, වාරියපොළ

---

පරිගණක නිර්මාණය : ගෝතමී ලියනගේ

අධීක්ෂණය හා උපදෙස් : ඩබ්.එල් හිරාන් පීරිස් (අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන), අයි.එස්.එම් හලීම්දීන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)